සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා

චක්‍රලේඛ ලිපි අංක **19/2020**

මගේ අංකයPPSC/ES/14/FI/02/30
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලය
නවනගරය,රත්නපුර
2020.09.11

ලේකම්,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2020**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.11 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/07/P2/09/CM/DEP/02 හා 2020.08.18 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරේ පුරප්පාඩු **03** සඳහා පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනට සක්‍රීය සේවයේ සිටින නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර සඳහා වැටුප් පරිමාණය MN 7 (රා.ප.ච 3/2016) අනුව රු 41,580-11X755-18X1030-68,425/- හිමි වේ.ආරම්භක වැටුප් පියවර 01 රු **41,580/-** වේ.

**1.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු වෘත්තීය සුදුසුකම්**

1. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ශ්‍රේණියේ (ක්‍රීඩා පුහුණුකරු) I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

හෝ

2. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ශ්‍රේණියේ (ක්‍රීඩා පුහුණුකරු ) II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

හෝ

3. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර-තාක්ෂණ සේවා ශ්‍රේණියේ (ක්‍රීඩා නිලධාරී) හා අධීක්ෂණ කළමනාකරණ සහකාර-තාක්ෂණික සේවා ශ්‍රේණියේ (ක්‍රීඩා පුහුණුකරු) වසර 25ක සේවා කාලය සම්පූර්ණ කරන ලද සහ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ වසර 08 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

හෝ

4. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ශ්‍රේණියේ (ක්‍රීඩා පුහුණුකරු) III ශ්‍රේණියේ වසර (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**2.0 සපුරාලිය යුතු වෙනත් සුදුසුකම්**

01. තනතුර ස්ථිර කර තිබීම.

02. පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම සහ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

04. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

05. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට සපුරා තිබිය යුතු බවට සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

**3.0 අයදුම්කළ යුතු අන්දම**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් හා ආදර්ශ අයදුම්පත් ආකෘතිය පසුපිටෙ සඳහන් වේ. එම පසුපිටෙ සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් සබරගමුව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කළ යුතු ය. ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් තමන්ට අයදුම්පත් ඉදිරිපත් වූ වහාම එකම ආවරණ ලිපියක් යටතේ මෙම කොමිෂන් සභාව වෙත **2020.10.02** දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. (එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය.) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සියලු සුදුසුකම් සලකා බැලේ.නියමිත සුදුසුකම් සපුරා ඇතැයි පෙනී යන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා වූ විභාග ප්‍රවේශපත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කාර්යාලීය ලිපිනයට යථා කාලයේදී නිකුත් කරනු ලැබේ..

පී.එස්.ආර්.එම් විජයරාජ O/C
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත්
01. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා

## 4.0 සීමිත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය | සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී/ක්‍රීඩා පුහුණුකරු තනතුරේ වසර 18 ක් සම්පූර්ණ වූ දින සිට එක් වසරකට ලකුණු 03 බැගින් | 30 | 30 | |
| 2.අතිරේක වෘත්තීය සුදුසුකම් | ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ<br><br>ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ පරිපාලනය පිළිබඳ උපාධිය -25<br>මාස 3 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා -15<br>මාස 01 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා -10<br>සති දෙකකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා -05<br>සති එකකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා -02 | 25 | 25 | |
| 3.පුහුණුකරුවෙකු වශයෙන් කටයුතු කිරීම | ක්‍රීඩක /ක්‍රීඩිකාවන් පුහුණු කිරීම නිසා ඔවුන් විසින් පළාත් හා ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ඊට ඉහළ මට්ටමක දී (රන්, රිදී, ලෝකඩ පදක්කම් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.) දක්වන ලද දක්ෂතා වෙනුවෙන්(එක් සහතිකයක් පමණි) (සනාථ කිරීම සඳහා ලිපි ලේඛන වාර්තාවල සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)<br><br>• ජාත්‍යන්තර මට්ටමේ සහතික ලබා තිබීම - 15<br>නියෝජනය කර තිබීම - 12.5<br>• ජාතික මට්ටමේ සහතික<br>1 වන ස්ථානය - 10<br>2 වන ස්ථානය - 7.5<br>3 වන ස්ථානය - 05<br><br>• පළාත් මට්ටමේ සහතික<br>1 වන ස්ථානය - 05<br>2 වන ස්ථානය - 03<br>3 වන ස්ථානය - 02<br><br>• ක්‍රීඩා පුහුණු සංවිධානයක් පවත්වා ගෙන යාම - 05<br>(ක්‍රීඩා පුහුණුකරුවෙකු වශයෙන් බඳවා ගැනීමේ දී ලකුණු ලබා දුන් සහතික පත් සඳහා මෙම තනතුරට බඳවා ගැනීමේ දී නැවත ලකුණු ලබා නොදිය යුතු ය) | 15 | 20 | 40% |
| 4.අමතර සුදුසුකම් | 1.ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පිළිගත් ජාත්‍යන්තර තරඟාවලියක් සඳහා (ආරාධිත තරඟාවලි නොවන) සහභාගී වන ක්‍රීඩා කණ්ඩායමක:<br>• පුහුණුකරුවකු වශයෙන් කටයුතු කර තිබීම - 10<br>• සහාය පුහුණුකරු වශයෙන් කටයුතු කර තිබීම -7.5<br>• අනුශාසක වශයෙන් කටයුතු කර තිබීම -05<br>• ජාතික මහා ක්‍රීඩා උළෙලකදී/ක්‍රීඩා පහන යටතේ - ලියාපදිංචි ජාතික සංගම් තරඟාවලියක පුහුණුකරුවකු - වශයෙන් කටයුතු කිරීම -05<br>(සනාථ කිරීම සඳහා සහතික කරන ලද ලිපි ලේඛන හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය.)<br>2.<br>• පිළිගත් ජාත්‍යන්තර තරඟයක ජාත්‍යන්තර විනිසුරු බලපත්‍රය හෝ තාක්ෂණික නිලධාරී සහතිකය -10<br>• ජාතික විනිසුරු බලපත්‍රය හෝ තාක්ෂණික නිලධාරියකු වීම -05 | 20 | 20 | |

| | | | | |
|---|---|---|---|---|
| 5.සේවා කුසලතා | i. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරේ වැඩ බැලීම -05<br>(විධිමත් පත්වීම් ලිපියක් තිබිය යුතු ය)<br>ii.ප්‍රශංසා සහතික සඳහා - 02<br>(ඇගයීමට ලක් වූ ක්‍රීඩා විෂය ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා වූ)<br>iii.ජාතික සංගම්වල නිලතල දැරීම - 01 | 05 | | |
| 6.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | සන්නිවේදනය හා පෞරුෂය -05 | 05 | 05 | |
| මුළු ලකුණු | | 100 | 100 | |

සටහන - "පිළිගත් ජාත්‍යන්තර තරඟ " යනුවෙන් අර්ථ ගන්වන්නේ ඔලිම්පික් ,ලෝක ශූරතා,පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟ ,ආසියානු තරඟාවලි,ආසියානු කණිෂ්ඨ ක්‍රීඩා තරඟ,දකුණු ආසියානු තරඟාවලි හා දකුණු ආසියානු කණිෂ්ඨ තරඟාවලිය ආදි ය.